(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 136.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 මාර්තු 05 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1185/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පූනහරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිලි/ මුලංගාවිල් මහා විද්‍යාලය යනුවෙන් ජාතික පාසලක් තිබෙන බවත්;

(ii) එම පාසලේ ගුරු පුරප්පාඩු, සේවක පුරප්පාඩු, ගෘහ භාණ්ඩ හිඟයක් සහ සම්පත් හිඟයක් මේ වනවිට පවතින අතර ඒ හේතුවෙන් එම පාසල අධ්‍යාපන කටයුතුවලදී යම් පසුබෑමකට ලක්වී ඇති බවත්;

(iii) එම පුරප්පාඩු/හිඟයන් සම්පූර්ණ නොකර එම පාසලේ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු ඉහළ නැංවිය නොහැකි බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පාසලේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පාසලේ කනිෂ්ඨ සේවක පුරප්පාඩු 17ක් පැවතියද, මේ වනතෙක් එම පුරප්පාඩු නොපිරවීමට හේතු කවරේද;

(iii) එම පාසලේ ගොඩනැගිලි අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන දිනය කවරේද;

(iv) එම පාසලේ ගෘහ භාණ්ඩ හිඟයට විසඳුම් ලබා දෙන දිනය කවරේද;

(v) ඉහත පාසලේ කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු සම්පූර්ණයෙන්ම පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1453/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිවු දිස්ත්‍රික්කයේ, ග්‍රාම නිලධාරි කොට්ඨාස 136 අතරින්, ග්‍රාම නිලධාරින්, සංවර්ධන නිලධාරින් සහ සමෘධි සංවර්ධන නිලධාරින් සඳහා භාවිතා කළ හැකි බහුකාර්ය කාර්යාල (සේවා පියස) නොමැති ග්‍රාම නිලධාරි කොට්ඨාස තිබේද;

(ii) එසේ නම්, තාවකාලිකව විකල්ප ස්ථානවල ක්‍රියාත්මක වන කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රතිසංස්කරණය කළ යුතු කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iv) වැසිකිලි, ජල සහ විදුලි පහසුකම් නොමැති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(v) විදුලිය විසන්ධි කර ඇති කාර්යාල සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අඩුපාඩු හේතුවෙන් මහජනතාවට ගුණාත්මක සේවාවක් සැපයීමට අපහසුතා පවතින බව දන්නේද;

(ii) ගුණාත්මක හා කඩිනම් සේවාවක් සැපයීම සඳහා අදාළ අඩුපාඩු සපුරාලීමට ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1501/2025

ගරු බී. ආරියවංශ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සුළු අපනයන භෝග කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා එම සුළු අපනයන භෝග අපනයනය කිරීමෙන් උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සුළු අපනයන භෝග අපනයනය කිරීම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1543/2025

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට සිට සීපෝත්, නාගස්තැන්න හරහා නාවලපිටිය දක්වා ඇති මාර්ගය වර්ෂ 20ක පමණ කාලයක සිට පිළිසකර නොකිරීමට හේතු කවරේද;

(ii) කොළඹ සිට නාවලපිටිය දක්වා විකල්ප මාර්ගයක් ලෙස ඉහත මාර්ගය භාවිත කළ හැකි බව දන්නේද;

(iii) ඉහත මාර්ගයේ කිලෝ මීටර් 9 සිට සංවර්ධනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර තිබුණේද;

(iv) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම සංවර්ධන කටයුතු නිසි ලෙස සිදු කර තිබේද;

(vi) එහිදී නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර තිබේද;

(vii) ඉහත මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1550/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, සත්ත්ව පාලනයේ නිරත වන විශාල පිරිසක් සිටින අතර ඔවුන් සතු ගවයන් සඳහා ප්‍රමාණවත් තෘණභූමි නොමැති බව දන්නේද;

(ii) එම දිස්ත්‍රික්කයේ පොතුවිල් ඇතුළු අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ගවයන් සඳහා තෘණභූමි සකසා දීම සඳහා කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා පවතින බාධා කවරේද;

(iv) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවීන පන්නයේ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම මඟින් කිරි නිෂ්පාදනය වැඩි කර සත්ත්ව පාලනයේ නිරතවන්නන්ගේ ආදායම ඉහළ නැංවීම තුළින් රටේ ආර්ථික සංවර්ධනයට දායක කරගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1677/2025

ගරු ඔෂානි උමංගා මහත්මිය,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජකාරියේදී මිය ගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ වැන්දඹුවන්/ යැපෙන්නන් සඳහා ලබා දෙමින් පැවති වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් හෝ දීමනා ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදවීම් වළක්වා ගැනීමට ගනු ලබන පියවර කවරේද;

(iii) ආබාධිත හේතුව මත සේවයෙන් ඉවත්වීමෙන් පසුව විවාහවූ හමුදා සාමාජිකයන් මිය ගිය පසු ඔවුන්ගේ වැන්දඹුවන්/යැපෙන්නන් සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා කවරේද;

(iv) ඔවුන් සඳහා දීමනා නොගෙවන්නේ නම්, එයට හේතු කවරේද;

(v) එම වැටුප් හෝ දීමනා ගෙවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2009.05.19 දිනට පෙර බඳවාගත් හමුදා සාමාජිකයන්ගෙන් 85%ක විශ්‍රාම වැටුප් හිමිකමක් නොලබන සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්‍රාම වැටුප් හිමිකම නොගෙවීම සඳහා හේතු කවරේද;

(iii) ඔවුන් සඳහා 85%ක විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සුදුසු බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ට එම විශ්‍රාම වැටුප් හිමිකම ගෙවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1786/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති වාහන සංඛ්‍යාව එක් එක් වාහන කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වාහන දුම් පරීක්ෂාව සිදු කරන ආයතනවලින් වාර්ෂිකව රජයට ලැබෙන ආදායම එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රථ වාහන තදබදය අවම කිරීම සඳහා සිදු කර ඇති ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1810/2026

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ සණස බැංකුවේ මුදල් තැන්පත්කරුවන් සම්බන්ධයෙන් ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) එම බැංකුවේ මුදල් තැන්පත් කොට අසාධාරණයට ලක්වූ තැන්පත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තැන්පත්කරුවන් විසින් තැන්පත් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එම තැන්පත්කරුවන් වෙනුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1830/2026

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ඒ ආශ්‍රිත ගම්මානවල ජනතාව මුහුණ දෙන මූලික හා හදිසි සෞඛ්‍ය ගැටලු පිළිබඳව දන්නේද;

(ii) දෙල්තොට අනුර ඩැනියෙල් දිස්ත්‍රික් රෝහල, ගලහ සහ පට්ටියගම-පල්ලේගම ප්‍රාදේශීය රෝහල්වල වත්මන් ශ්‍රේණිගත කිරීම කවරේද;

(iii) එම රෝහල්වල අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය කොපමණද;

(iv) එම රෝහල්වල හදිසි ප්‍රතිකාර, සැත්කම්, දැඩි සත්කාර සහ ප්‍රසව හා නාරිවේද විශේෂඥ සේවාවන් නොමැති වීම හේතුවෙන් රෝගීන් මහනුවර සහ පේරාදෙණිය රෝහල් වෙත මාරු කිරීමේදී රෝගීන් මරණයට පත්වන බව දන්නේද;

(v) දෙල්තොට අනුර ඩැනියෙල් දිස්ත්‍රික් රෝහල, මූලික රෝහලක් ලෙස ශ්‍රේණිගත කිරීමටත්, ගලහ සහ පට්ටියගම-පල්ලේගම ප්‍රාදේශීය රෝහල් සංවර්ධනය කිරීමටත් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'දිට්වා සුළි කුණාටුව' හේතුවෙන් මෙම ප්‍රදේශවල මාර්ග අබලන්වී ඇති පසුබිමක, හදිසි ප්‍රතිචාර සඳහා ඉහත සඳහන් රෝහල්වලට අමතර ගිලන් රථ ලබාදීමටත්;

(ii) ගලහ සහ දෙල්තොට ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය අයිතිවාසිකම් තහවුරු කිරීමට විශේෂ ශ්‍රම බලකායක් පත්කර විසඳුම් ලබාදීමටත්;

පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1831/2026

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයට අදාළව 2025/2026 වසර සඳහා යෝජනාවී ඇති කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කලාපයේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ මඩකලපුව ශාඛාව හරහා මෙම වසර තුළ කාර්මික පුහුණුව ලැබූ දේශීය ව්‍යවසායකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) මඩකලපුව දිස්ත්‍රික්කයේ කුඩා හා මධ්‍යම පරිමාණ අත්යන්ත්‍ර කර්මාන්ත සඳහා වෙළඳපොළ අවස්ථා පහසු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා ලබාදී ඇති අඩු පොලී ණයවල සමස්ත වටිනාකම කොපමණද;

(v) නැගෙනහිර පළාතේ කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා විශේෂිත බදු සහන ලබා දීමට කටයුතු කර තිබේද;

(vi) මඩකලපුව දිස්ත්‍රික්කයේ අපහසුතාවයන්ට ලක්වී සිටින ව්‍යවසායකයින් සඳහාවූ 'SME ඇපකර අරමුදල' හි වර්තමාන ප්‍රගතිය කවරේද;

(vii) එම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ඇසුරුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සැලසුමක් තිබේද;

(viii) ආනයනික විකල්පවලින් දේශීය කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*5.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

6.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1851/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1989.11.13 වන දින ඝාතනය කරන ලද ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ රෝහණ විජේවීර මහතාගේ මරණයෙන් පසු, ඔහුගේ බිරිඳ සහ දරුවන්ව ආරක්ෂා කිරීම සඳහා රජයේ රැකවරණය ලබාදීමට රජය විසින් කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එලෙස රජයේ රැකවරණය ලබා දුන් තැනැත්තන්, රෝහණ විජේවීර මහතා සමඟ තිබූ ඥාති සම්බන්ධතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තැනැත්තන් රඳවාගෙන සිටි ස්ථාන කවරේද;

(iv) වර්තමානයේ රජයේ රැකවරණය සහ නඩත්තු ලබන රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන් කවුරුන්ද;

(v) රෝහණ විජේවීර මහතාගේ පවුලේ සාමාජිකයන්ගේ නඩත්තුව සඳහා මෙතෙක් රජය විසින් දරා ඇති ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(vi) වර්තමානයේ රජයේ රැකවරණය ලබන එම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව සහ නඩත්තුව සඳහා මසකට රජය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?